රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 17/88.

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1988 මැයි මස 26 වන දින.

සියලුම අමාත්‍යාංශවල ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල ප්‍රධානීන් වෙත.

රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල --
දෙපාර්තමේන්තු විසින් කොටස් මුදල් ගෙවීම් නතර කිරීම.

රා.සේ.අ.අරමුදලේ දායකත්වය අවසන් කළ දායකයිනට ඔවුන්ගේ අනිවාර්ය දායක මුදලෙන් 85% ක් සහ ස්වේච්ඡා දායක මුදලෙන් 100% ක් ගෙවීම දෙපාර්තමේන්තුවලට බලය දුන් 1977.08.09 දින අංක:37 දරන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6 වන ඡේදය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

02. අරමුදලේ දායකත්වය අවසන් කළ දායකයින්ට 1988.07.01 දින සිට සියලුම කොටස් මුදල් ගෙවීම් නවතා, ඒ වෙනුවට සම්පූර්ණ දායක මුදල ආපසු ගෙවීම සඳහා වූ ඉල්ලුම්පත් රා.සේ.අ.අ.ලේකම් වෙත ඉදිරිපත් කරනු මැනවි. දායක මුදල් අයකරගත් මුළු කාලසීමාව සඳහා නිසි ලෙස පූරණය කළ අවකරණ ලේඛණ ඔහු වෙත යවා, ඇත්නම් මාසයක් ඇතුළත සම්පූර්ණ ප්‍රදානයව ගෙවීම අනුමත කරන බවට ඔහු සහතික වනවා ඇත.

03. රා.සේ.අ.අ.ලේකම් විසින් අනුමත කරනු ලබන අවසාන ප්‍රදානයන්, රා.සේ.අ.අ.ගිණුම හර කොට ගෙවා, එම මුළු ගෙවීම් වවුචර සහ ප්‍රදාන පත්‍රවල අනුපිටපත් ඊළඟ මාසයේ 15 වන දිනට පෙර ඔහු වෙත ඉදිරිපත් කළ යුතුය.

Siriwardhana

ලේකම්.
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.